# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 අගෝස්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 අගෝස්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 33 දරන ණය මණ්ඩල
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 60/72

ණය මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

400 වන අධිකාරයේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන ණය මණ්ඩල ආඥාපනතේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ගණන් පොත් පවත්වා ගෙන යාම මණ්ඩලයේ යුතුකම බව.

14. (1) ණය මණ්ඩලයට ලැබෙන, ණය මණ්ඩලය විසින් ගෙවනු ලබන හෝ වියදම් කරනු ලබන, නැතහොත් ණය මණ්ඩලයට අයවිය යුතු සියලුම මුදල් ප්‍රමාණයන් පිළිබඳව සහ මුදල් වැය කරනු ලබන විවිධ ද්‍රව්‍ය, කරුණු සහ දේවල් ද පිළිබඳව එක් එක් මුදල් වර්ෂයේ නිවැරදි හා විධිමත් ගිණුම් ඇතුළත් කළ යුතු පොතක් හෝ පොත් ඒ සම්බන්ධයෙන් ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීති සහ නියෝගවලින් නියම කර තිබිය හැකි ආකාරයට සහ ක්‍රමයට පවත්වා ගෙන යා යුතු යයි ණය මණ්ඩලයේ කොමසාරිස්වරුන් විසින් කලින් කල නියම කළ හැකි ය; නොහොත් විධාන කළ හැකි ය.

(2) එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන දොළොස් මසක කාල පරිච්ඡේදය ණය මණ්ඩලයේ මුදල් වර්ෂය වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට ඇති බලය.

15. 14 වන වගන්තිය යටතේ හෝ අන්‍යාකාරයකින් හෝ තබනු ලබන ණය මණ්ඩලයේ සියලු ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබීමට යටත් වන අතර ඔහු විසින් ම හෝ ඔහු විසින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ යම් තැනැත්තකු මගින් හෝ සියලු ගිණුම් පොත් හා ලේඛන පරීක්ෂා කිරීමට ද ඒ ගිණුම් හරි වැරදි බැලීම සඳහා අවශ්‍ය සියලු උකස්කර, ගිවිසුම්, වවුචර සහ කවර ස්වභාවයක වූ හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට ද විගණකාධිපතිවරයාට සෑම විට ම බලය ඇත්තේ ය.".

කේ 22835—9331 (73/6)

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් ආපසු ගෙවීම.

18. 12 වන වගන්තිය යටතේ කරන ලද ආයෝජනවලින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ණය මණ්ඩලයට ලැබිය යුතු මුළු පොලී ප්‍රමාණයෙන්, මණ්ඩලයේ කටයුතු පිළිබඳ කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුව විසින් දරනු ලැබූ හෝ වැය කරනු ලැබූ වියදම්වල මුළු මුදලට සමාන හෝ ආසන්නතම වශයෙන් සමාන යයි අමාත්‍යවරයා විසින් සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තත් කාලයෙහි අනුමත කර තිබෙන මුදලට සමාන වන මුදල් ප්‍රමාණයක් කොමසාරිස්වරුන් විසින්, ඒ එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන්, ඒ ආණ්ඩුවට ගෙවිය යුතු ය. ".